සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය

RICHMOND COLLEGE LIB... GALLE

**නම/විභාග අංකය :- ........................................................................** **කාලය :- පැය 02 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- ඉතා සුදුසු පිළිතුර තෝරන්න.

01. 'මආද්' යන අරාබි පදෙහි අරුත,
(1) දූත මෙහෙවර (2) පරමාන්ථ ජීවිතය (3) නබිත්වය (4) ඒක දේවත්වය

02. ගින්නෙන් මවන ලද්දන්,
(1) මලක්වරු (2) නබිවරු (3) මිනිසුන් (4) ජින්වරු

03. ඉස්ලාම් නැමැති පදෙහි තේරුම් අතරින් එකකි,
(1) භාරවීම (2) සහජීවනය (3) ඉවසීම (4) පාරිශුද්ධිය

04. "වහී ලියන්නන්" යන අරුත දෙන අරාබි පදය,
(1) කිරාමුන් කාතිබූන් (2) අස්හාබුස් සුෆ්ෆා
(3) කුත්තාබුල්වහි (4) ආමිලූන්

05. නබි(සල්) විසින් යෙමන් ප්‍රදේශයට යවනු ලැබූ ආණ්ඩුකාරතුමා,
(1) මුස්අබ් (රළි) (2) ජඃෆර් (රළි) (3) මුආද් (රළි) (4) සෙයිද් (රළි)

06. 'මාඋන් තාහිර්' වලට උදාහරණයකි.
(1) මුහුදු වතුර (2) තැඹිලි වතුර (3) කානු වතුර (4) ළිං වතුර

07. 'හිස මස්හු කිරීම' වුළුහි,
(1) සුන්නත් වේ. (2) ෂර්ත් වේ. (3) මක්රූහ් වේ. (4) ෆර්ළු වේ.

08. නබිතුමා අහස් තලයට ගිය ගමන,
(1) මිඃරාජ් (2) ඉස්රා (3) හිජ්රත් (4) රිහ්ලා

09. ෂිර්ක් හෙවත් ආදේශ කිරීමට අනතුරුව පවතින මහා පාපය,
(1) හූනියම් කිරීම. (2) සූදු කෙළීම.
(3) සොරකම (4) දෙමව්පියන්ට බැනවැදීම.

10. "විද්වතුන් නබිවරුන්ගේ පසු උරුමක්කරුවන් වේ." යනු,
(1) හදීසයකි. (2) ඉමාම්වරුන්ගේ අදහසකි.
(3) සහාබි වදනකි. (4) කුර්ආන් වැකියකි.

11. සලාතයේ ෆර්ළයන්ගෙන් එකකි.
(1) කිබ්ලාවට මුහුණලා සිටීම. (2) අවසාන අත්තහියියාත් ඉසිරීම.
(3) 'වජ්ජහ්තු' ඉසිරීම (4) වේලාව දැනසිටීම.

12. "ඉක්රඃ" යන වදනින් ආරම්භ වන සූරාව,

(1) සූරා බලද් (2) සූරා අලක් (3) සූරා මාඌන් (4) සූරා කෞසර්

13. 'ඉඛ්ලාස්' හෙවත් අරාබි පදයෙහි තේරුම,

(1) පිවිතුරු බව (2) වර්ධනය (3) දියුණුව (4) පිරිසිදු

14. අල්කුර්ආන්හි ජුස්උ ගණන,

(1) 30 කි. (2) 7 කි. (3) 114 කි. (4) 6666 කි.

15. "ඇත් වර්ශය" යන අරුත දෙන අරාබි පදය,

(1) අයියාමුල් බීල් (2) ආමුස් සෙයිෆ් (3) ආමුල් හුස්න් (4) ආමුල්ෆීල්

16. තම අවශ්‍යතාවයන් නොතකා මුහාජිර්වරුන්ගේ අවශ්‍යතාවයන්ට මුල්තැන දුන් අය,

(1) සහාභාවරු (2) කුරෛශ්වරු (3) අන්සාරිවරු (4) සාලිහ්වරු

17. ඉස්ලාමීය දින දර්ශණ අනුව නවවැනි මාසය,

(1) රමළාන් (2) රජබ් (3) ෂව්වාල් (4) ෂඃබාන්

18. අල්කුර්ආන්හි තුනෙන් කොටසකට සමාන වන සූරාව,

(1) සූරතුල් මාඌන් (2) සූරතුල් ෆලක් (3) සූරතුල් ඉඛ්ලාස් (4) සූරා නාස්

19. සූරා ෆීල් හි අඩංගු ආයත් ගණන,

(1) 7 (2) 4 (3) 6 (4) 5

20. සලාතයේ ෂර්ත් අතරින් එකකි.

(1) පළවෙනි සුජූදය (2) තිබ්ලාවට මුහුණලා සිටීම.

(3) පළවෙනි සලාම් පැවසීම. (4) ඉඃතිදාල්හි අල්ලාහ්ව පැසසීම.

## II කොටස

- **කොටස් 'අ' , 'ආ' අතරින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා , පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළවෙනි ප්‍රශ්නයට ලකුණු '16' ක්ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු '11' ක් බැගින් ද හිමි වේ.**

01. පාසල් පාදක ඇගයීම ක්‍රියාවලියෙහි "සලාත්" යන තේමාව යටතේ ඔබ විසින් ඉටු කරනු ලද පැවරුම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඉස්ලාම් හි පස් මහා වගකීම් අතරින් 4ක් නම් කරන්න.

(2) මුස්ලිම්වරයෙකුව කුෆ්රයෙන් වෙන්කර දක්වන ඉබාදතය කුමක්ද?

(3) සලාත් සම්බන්ධ කුර්ආන් වැකියක් සඳහන් කරන්න.

(4) ජමාඅත් සලාතයේ වැදගත්කම දක්වන හදීසයක් සඳහන් කරන්න.

(5) සලාත් මඟින් අත්කර ගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(6) සලාතය පැහැර හැරීමෙන් සිදුවන පලවිපාක තුනක් ලියන්න.

## 'අ' කොටස

02. (1) 'ආමන්තු බිල්ලාහි' යන්නෙහි අරුත ලියන්න.

(2) දුර්ගුණාංග තුනක් සඳහන් කරන්න.

(3) ජල වර්ග සඳහන් කරන්න.

(4) උපවාස රැකීමෙන් වර්ධනය වන යහගුණ තුනක් ලියන්න.

03. (1) ධනය පිරිසිදු කරන වගකීම කුමක්ද?

(2) අල්ලාහ්ගේ විශාල මැවුම් තුනක් සඳහන් කරන්න.

(3) සාමාන්‍ය ය නජීසය සඳහා උදාහරණ තුනක් ලියන්න.

(4) දෙමව්පියන්ට කළ යුතු උපකාර තුනක් සඳහන් කරන්න.

04. (1) පළවෙනි සූර් නළාව පිඹීමත් සමඟ සිදුවන සිදුවීම් ලියන්න.

(2) සවුම්හි වැදගත්කම අවධාරණය කරන හදීසයක් ලියන්න.

(3) දේවබිය ඇති කරන යහක්‍රියාවන් තුනක් සඳහන් කරන්න.

(4) මලක්වරුන්ගේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

## 'ආ' කොටස

05. (1) සූරා 'ඉත්ලාස්' අමතතු ලබන වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

(2) දිවෙන් සිදුවන පාපකර්ම තුනක් සඳහන් කරන්න.

(3) අල්කුර්ආන්හි අවසානයට යෙදී තිබෙන සූරා තුන නම් කරන්න.

(4) කුර්ආන් පාරායනා කිරීමේ දී පිළිපැදිය යුතු පිළිවෙත් තුනක් සඳහන් කරන්න.

06. (1) රමළාන් මාසෙට අයත් විශේෂ රාත්‍රිය නම් කරන්න.

(2) 'කලාමුල්ලාහ්' , 'කිරාඅතුල් කුර්ආන්' යන අරාබි පදයන් හි තේරුම් ලියන්න.

(3) සවුම්හි ෆර්ළ් දෙක ලියා දක්වන්න.

(4) ප්‍රධාන මලක්වරු තිදෙනෙක් නම් කර, ඔවුන් හට පවරා තිබෙන කාර්යයන් ද සඳහන් කරන්න.

07. (1) ඇත් සේනාව විනාශ කළ පක්ෂීන් නම් කරන්න.

(2) ඉස්ලාම් හි සුවිශේෂතා තුනක් සඳහන් කරන්න.

(3) ඉස්ලාම් යන පදයෙහි අරුත් තුනක් ලියා දක්වන්න.

(4) අන් අයගේ නිවසට ඇතුල්වීමට පෙර අවසර ලබා ගන්නා ක්‍රම තුනක් සඳහන් කරන්න.